වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව
පුත්තලම දිස්ත්‍රික්කය
-------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
---------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2016 මාර්තු 14 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශනය 2015 මාර්තු 11 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජුලි 20 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනයකළ මතය
------------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
--------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
---------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ජංගම ගිණුම් 03 ක් සහ තැන්පත් ගිණුම් සඳහා ප්‍රධාන ලෙජරයේ වෙන වෙනම ලෙජර් ගිණුම් පවත්වා නොතිබුණි.

(ආ) අවසන් තොගයේ වටිනාකම රු.13,282 ක් අඩුවෙන් හා රු.524 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) වෙනත් ආදායම් රු.33,650 ක් වීථි රේඛා ගාස්තු ලෙස ද, රු.8,700 ක් වූ කායවර්ධන මධ්‍යස්ථානයේ සහ රු.350 ක් වූ ආයුර්වේද මධ්‍යස්ථාන ආදායම් පුස්තකාල සාමාජික ගාස්තු ලෙස ද ගිණුම්ගත කර තිබුණි.

1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
--------------------------------

2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම් පිළිවෙලින් රු.15,016,046 ක් හා රු.11,820,801 ක් වූ අතර, එයින් වර්ෂයකට වඩා වැඩි එම ශේෂයන්ගේ එකතු වටිනාකම පිළිවෙලින් රු.3,866,459 ක් සහ රු.5,745,206 ක් විය.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම
----------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 977,574 ක් වූ ගිණුම් ශේෂ සතුටුදායක ලෙස කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන්ට අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.16,258,030 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,933,782 ක් විය.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

<u>වියදම් ව්‍යුහය</u>

සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ අයවැයගත සහ තථ්‍ය වියදම අතර විචලනයන් ද සමඟ පහත දැක්වේ.

| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| <u>පුනරාවර්තන වියදම</u> | | | |
| පුද්ගලික පඩිනඩි | 19,326 | 24,946 | (5,620) |
| අනෙකුත් | 26,190 | 21,639 | 4,551 |
| උප එකතුව | 45,516 | 46,585 | (1,069) |
| ප්‍රාග්ධන වියදම | 91,300 | 113,797 | (22,497) |
| මුළු එකතුව | 136,816 | 160,382 | (23,566) |

### 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

පසුගිය වර්ෂයේ ජංගම වත්කම් හා ජංගම වගකීම් අතර අනුපාතය 1.35 : 1 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ එය 2.14 : 1 ක් විය. එහි සම්මත අනුපාතය 2 : 1 ක් විය.

### 2.4 ආදායම් පරිපාලනය

#### 2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| වරිපනම් හා බදු | 990 | 894 | 1,118 |
| කුලී | 28,891 | 28,120 | 1,137 |

| | | | |
|---|---|---|---|
| බලපත්‍ර ගාස්තු | 308 | 308 | -- |
| සේවා සඳහා ගාස්තු | 593 | 593 | -- |
| වරෙන්තු හා දඩ | 1,569 | 2,530 | 313 |
| වෙනත් ආදායම් | 3,573 | 2,657 | 4,493 |

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී සභාව විසින් හිඟ ආදායම් හා බිල්කල ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| ආදායම් ශීර්ෂය | 2015.01.01 දිනට හිඟ ආදායම | හිඟයෙන් අයවීම | වර්ෂය තුළ බිල්කල ආදායම | බිල්කල ආදායමින් අයවීම | 2015.12.31 ට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| වරිපනම් හා බදු | 1,133 | 485 | 887 | 417 | 1,118 |
| කුලී | 431 | 18 | 2,876 | 2,152 | 1,137 |
| වරෙන්තු හා දඩ | - | - | 1,491 | 1,177 | 313 |
| වෙනත් ආදායම් | 3,594 | 1,467 | 2,368 | - | 4,493 |

### 2.4.2 වරිපනම් හා බදු

වරිපනම්, අක්කර හා ජල බදුවල මුළු හිඟය රු.1,117,831 ක් වු අතර, වර්ෂ 05 කට වැඩි එම හිඟ බදු රු.257,356 ක් විය. එසේම 2015 ජල බදු අයවීමේ ප්‍රගතිය දුර්වල තත්ත්වයක පැවතුණි.

වර්ෂ 05 කට වැඩි හිඟ වරිපනම් හා අක්කර බදු ශේෂයන්වල එකතුව එම බදුවල මුළු හිඟයෙන් සියයට 36ක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

### 2.4.3 බදු කුලී

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ බදු කුලී රු.287,264 ක් වූ අතර, එයින් රු.10,250 ක් අවුරුදු 03 - 05 ත් අතර, කාල පරාසයක සිට අය නොවී පැවතුණි.

### 2.4.4 කඩකුලී

2015 දෙසැම්බර් 31 දිනට හිඟ කඩකුලී රු.858,290 ක් වූ අතර, එයින් රු.419,543 ක් අවුරුදු 1-3 ත් අතර, කාල පරාසයක සිට අයවීම හිඟව පැවතුණි.

### 24.5 බලපත්‍ර ගාස්තු

ඉකුත් වර්ෂයේ දී රු.214,440 ක බලපත්‍ර ගාස්තු අයකර ගෙන තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ දී එය රු.179,560 ක් විය.

2.4.6 සේවා සඳහා ගාස්තු
---------------------

ඉකුත් වර්ෂයේදී රු.575,188 ක් සේවා ගාස්තු අයකරගෙන තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ එය රු.722,103 ක් විය.

2.4.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු
-----------------------------

2015 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ උසාවි දඩ මුදල රු.313,333 ක් වූ අතර, එදිනට අයවිය යුතුව තිබූ රු.4,492,700 ක මුද්දර ගාස්තු ගෙන්වා ගැනීමට පියවර ගෙන නොතිබුණි. එම හිඟ ශේෂය තුළ අවුරුදු 1 – 3 අතර හිඟ රු.2,348,869 ක් ද, ඇතුළත්ව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
--------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
---------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුල සභාවේ අරමුදල් උපයෝජනය කර කිසිදු සංවර්ධන කර්මාන්තයක් ඉටු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විශ්‍රාම ගිය, ස්ථාන මාරු වී ගිය, හා සේවය හැරගිය නිලධාරින්ගෙන් අයවිය යුතු සේවක ණය රු.13,758 ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) 2002 ජනවාරි සිට 2013 මාර්තු දක්වා සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් නියමිත දිනට නොගෙවීම නිසා රු.43,341 ක අධිභාරයක් ගෙවීමට සභාවට නියමකර තිබුණද, එම අධිභාරය මෙතෙක් නිරවුල් කර නොතිබුණි.

(ඈ) 2015 වර්ෂය සඳහා කාර්ය සාධන වාර්තා පිළියෙල කර නොතිබුණි.

3.2 මානව සම්පත් කළමනාකරණය
------------------------------------

සභාවේ ලේකම් තනතුර, ද්විතියික ශ්‍රේණියේ තනතුරු 08 ක හා ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු 02 ක පුරප්පාඩු පැවති අතර, ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු 08 ක 21 දෙනෙකු හා ද්විතියික ශ්‍රේණියේ තනතුරක් සඳහා එක් අයෙකුද, සේවයේ යොදවා තිබුණි.

3.3 වත්කම් කළමනාකරණය
-----------------------------

නිෂ්ක්‍රීය වත්කම්
-------------------

සභාව සතු රු.1,070,000 ක් වටිනා වත්කම් විෂයයන් 12 ක් සහ වටිනාකම තක්සේරු නොකල වත්කම් වර්ෂයන් 05 ක් වර්ෂ ගණනාවක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

3.4 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

---

කිසිදු තක්සේරුවකින් හා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව ගහේවාඩිය සංචාරක බංගලාව 2015 මාර්තු 01 දින සිට මසකට රු.30,100 ක් බැගින් වර්ෂ 30 ක කාලයකට බදු දී තිබුණි. එසේම සුනාමි ව්‍යසනය අවස්ථාවේදී සභාව වෙත ලබාදී තිබූ අශ්ව බල 125 ක පිටතින් සවිකරන ඇන්ජිම සහිත ෆයිබර් බෝට්ටුවද, 2015 මාර්තු 01 දින සිට මසකට රු.15,100 ක කුලී පදනම මත ඉහත කී බදුකරුටම ලබාදීමට සභාව කටයුතු කර තිබුණි.

3.5 හඳුනාගත් අලාභ

---

2012 සිට 2014 දක්වා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන්ට අනුව එකතුව රු.233,342 ක් වටිනා පුස්තකාල පොත් 1516 ක් අස්ථානගතව තිබුණි. 2015 වර්ෂික භාණ්ඩ සමීක්ෂණයට අනුව අස්ථානගත වූ පොත් 658 ක් වූ අතර, ඒවායේ වටිනාකම රු.104,311 ක් විය. එම අලාභ ඊට වගකිවයුත්තන්ගෙන් අයකර ගෙන නොතිබුණි.

3.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---

'පිළිසරු' ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියේ සමාලෝචිත වර්ෂයේ රු.3,875,897 ක ප්‍රතිපාදනය උපයෝගී කරගෙන සභාව රු.3,169,300 ක මුදලකට ව්‍යාපෘතිය ඉටු කිරීමට කොන්ත්‍රාත්කරුවන් සමඟ ගිවිසුම්වලට එළඹ තිබුණි. 2015 වර්ෂයේ දී ලැබී තිබූ රු.2,667,713 ක ප්‍රතිපාදනවලින් රු.2,483,559 ක් වටිනා බිල්පත් නිරවුල් කර තිබුණු අතර, රු.184,154 ක් ගිණුමේ ඉතිරිව තිබුණි. ගෙවීමට ඇති බිල්පත්වල වටිනාකම රු.563,887 ක් වූ අතර, එම මුදලින් අත්තිකාරම් මුදල් රු.173,975 ක් පියවීමෙන් පසුව ගෙවීමට ඇති මුදල් වන රු.389,912 ක මුදල පියවීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබා නොගැනීම නිසා ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අවසන් කර භාරදීම සිදුකර නොතිබුණි. විශාල මුදලක් වැයකර ප්‍රදේශයේ කසල ප්‍රතිචක්‍රීකරණ වැඩ සටහනක් සඳහා යොදා ගෙන තිබුණ මෙම ව්‍යාපෘතියට එක් සේවකයකු පමණක් සේවයේ යෙදවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයටද ඌන උපයෝජිතව පැවතුණි.

4. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය

---

4.1 අයවැය පාලනය

---

සමාලෝචිත වර්ෂයේ අයවැයගත ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රතිපාදනය රු.91,300,000 ක් වූ අතර, එහි තථ්‍ය වියදම රු.113,796,770 ක් වූයෙන් අයවැය ප්‍රතිපාදන ඉක්මවා රු.22,496,770 ක් වියදම් කර තිබුණි. එහි විචලනය සියයට 25 ක් විය.

5. පද්ධති හා පාලන

---

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) ඝණ අපද්‍රව්‍ය කළමණාකරණය